**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය - 2015**

**-----------------------------------------------------------**

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1999 අංක 17 දරන සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 9 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීත්තර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3

ප්‍රමිතයේ 12 වන වගන්තිය පරිදි ගනුදෙනු හා සිද්ධීන් සම්බන්ධව නිශ්චිත රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයක් නොමැති අවස්ථාවලදී කළමනාකරණය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් නිර්මාණය කර ව්‍යවහාරය කිරීම පිණිස සිය විනිශ්චය උපයෝගී කර ගත යුතු වේ. මීට පටහැනිව වර්ෂ 5 කට අධික කාලයක සිට හිඟ හිටි ආදායම් ශේෂයෙන් සියයට 75 ක් හෙවත් රු. 32,898,350 ක් ප්‍රවර්තන වර්ෂයේදී කපා හැර තිබුණු අතර අදාළ එක් එක් වර්ෂවල ලාභයට ගලපනු වෙනුවට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයට ගලපා තිබුණි. තවද රු.28,766,675 ක්වූ බැංකු අයිරාව ජංගම වගකීම් යටතේ දක්වනු වෙනුවට මුදල් හා මුදල් සමාන දෑවල ඇතුළත් කර ජංගම වත්කම් වලින් හිලව්කර දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7

(i) ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂික සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. මිලියන 259.8 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 49 වන වගන්තිය ප්‍රකාරව වත්කමක් ප්‍රත්‍යාගණනය කරන්නේ නම් එම වත්කම අයත්වන වත්කම් පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, අධිකාරිය විසින් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේදී බෝගම්බර, නුවරඑළිය සහ ආර්. ප්‍රේමදාස ක්‍රීඩාංගනය යන ස්ථානවල භාවිතා කරනු ලබන 2015 ජනවාරි 01 වන දිනට පිරිවැය රු.8,307,878 ක් වූ යන්ත්‍ර සූත්‍ර ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(iii) ප්‍රමිතයේ 69 වන වගන්තිය ප්‍රකාරව වත්කමක් ක්ෂය කිරීම ආරම්භ කළ යුත්තේ එය පාවිච්චිය ආරම්භ කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසු වුවද, සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ ඉදි කරන ලද කඩ සාප්පු හා කාර්යාල ගොඩනැගිල්ලේ අත්තිවාරම පමණක් ඉදිකර ඇති අතර ඒ සඳහා වැය කළ රු.16,103,042 ක මුදල 2014 වර්ෂයේදී ප්‍රාග්ධනීත කර 2014 සහ 2015 වර්ෂ සඳහා ක්ෂය ලෙස රු.805,152 ක් ප්‍රතිපාදනය කර තිබුණි.

(iv) ප්‍රමිතයේ 90 වන වගන්තිය ප්‍රකාරව රු.9,334,652 ක් වටිනා ප්‍රත්‍යාගණිත යන්ත්‍ර සූත්‍ර හා උපකරණ පිළිබඳව අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

**2.2.2 අසම්භාව්‍ය බැරකම්**

---------------------------

අධිකාරියට අයත් ද්විත්ව කාර්ය වාහනයක් මගින් සිදු වූ මාරක රිය අනතුරක් හේතුවෙන් මිය ගිය දැරියගේ පාර්ශවය විසින් රු. මිලියන 50 ක වන්දියක් ඉල්ලා නුගේගොඩ දිසා අධිකරණයේ පවරන ලද නඩුවක් නිසා පැන නැඟී ඇති අසම්භාව්‍ය බැරකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර මෙම අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ආපසු ගෙවනු ලබන තැන්පතු වටිනාකම මූල්‍ය ප්‍රකාශන අනුව රු.10,669,696 ක් වූ අතර විගණනයට ඉදිරිපත් කළ උපලේඛන අනුව එම ශේෂය රු.15,191,048 ක් වුයෙන් රු.4,521,352 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ ගිණුම් අනුව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් අයවිය යුතු වටිනාකම රු. 21,153,845 ක් වුවද ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ගිණුම් අනුව රු.18,373,845 ක් වුයෙන් රු. 2,780,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

----------------------------------------

විවිධ ණයගැතියන්ගෙන් අයවිය යුතු ශේෂවල එකතුව රු. 43,912,053 ක් වූ අතර, එම ශේෂ වල ඇතුළත් වර්ෂ 05 කට වැඩි කාලයක් ඉකුත් වූ රු.32,744,245 ක් අය කර ගැනීමට අධිකාරිය විසින් ඵලදායී පියවර ගෙන නොතිබුණි.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

--------------------------------------

පහත සඳහන් ගිණුම් විෂයයන්වලට අදාල සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොවීය.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| වෙළඳ ණයගැතියෝ වෙනත් ණයගැති සහ රුඳවුම් මුදල් | 71,696,742 | ශේෂ සනාථ කිරීම් හා විස්තරාත්මක උපලේඛන |
| තොගය | 2,149,491 | තොග ලේඛන හා සමීක්ෂණ වාර්තා |

**2.2.6 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

---

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති රීති රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| **(අ)** 1999 අංක 17 දරන සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරි පනතේ 3 (2) ඡේදය | අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය තුළ ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුරක් ඇති කර නොතිබූ නමුත්, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු මාසිකව රු. 60,000 ක් ගෙවීමේ පදනම මත ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුරට පත් කර තිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් නොවූ මාස 6 ඉකුත් වූ එකතුව රු.420,598 ක් වූ චෙක්පත් 22 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරිමට අධිකාරිය විසින් කාලීනව පියවර ගෙන නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571 | වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු. 2,386,109 ක් වූ තැන්පතු ආපසු ගෙවීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 754 | මුදල් වර්ෂය අවසානයේදී, බඩු වට්ටෝරු පොත් තුළනය කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 755(1) | රාජකාරි අත්හැරීමට, මාරුවක් ලැබ යාමට නැතහොත් දීර්ඝ නිවාඩුවක් ලැබ යාමට පෙර, ඔහු විසින් ඔහුගේ අනුප්‍රාප්තිකයාට හෝ එම කාර්යය පවරනු ලැබ සිටින වෙන ඕනෑම නිලධාරියෙකුට තම වගකීම යටතේ ඇති සියලුම රජයේ භාණ්ඩ හා වෙනත් දේපළ බාර දී ඒවා බාරගත් නිලධාරියාගෙන් ඒවා ලැබුණු බවට පිටපත් දෙකකින් යුක්ත කුවිතාන්සියක් ලබාගත යුතු වුවද 2016 පෙබරවාරි 02 දින සේවයෙන් විශ්‍රාම ගත් ගබඩා භාරකරු විසින් ඉහත පරිදි ක්‍රියාකර නොතිබුණි. |
| (v) මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි. |
| (vi) මුදල් රෙගුලාසි 758 | සෝදිසි සමීක්ෂණ සිදුකර අනවශ්‍ය තොග හෝ භාවිතා කළ නොහැකි තොග හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (vii) | මුදල් රෙගුලාසි 762 | තොග මට්ටම් නිශ්චය නොකර මිලදී ගැනීම හේතුවෙන් අවශ්‍ය ප්‍රමාණයට වඩා තොග පැවති අතර වසර 1 සිට වසර 13 ක කාලයක් දක්වා නිකුත් නොකළ ලිපිද්‍රව්‍ය, විදුලි උපාංග, ජලනල උපාංග, තීන්ත වර්ග යනාදී එකතු වටිනාකම රු.1,252,847 ක්වූ තොග ශේෂ පැවතුණි. |
| (ඇ) | අංක අයිඒඅයි/1/2002/02 හා 2002 නොවැම්බර් 18 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා මෘදුකාංග සඳහා වෙනම ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ඉ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 මාර්ගෝපදේශය | ගෙවන ලද වැට් බදු පිළිබඳ විස්තර මාසිකව විගණකාධිපති වෙත වාර්තා කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.246,797,597 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.71,308,087 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.175,489,510 කින් හෙවත් සියයට 246 කින් පිරිහී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ආදායම රු. 34,992,303 කින් අඩුවීම සහ අඩමාණ ණය රු.32,898,350 ක් වෙන් කිරීම ඉහත මූල්‍ය ප්‍රතිඵලය පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමක් සිදු වී තිබුණි. එහෙත් 2013 වර්ෂයට සාපේක්ෂව එම පිරිහීම 2014 වර්ෂයේදී අඩු වී තිබූ අතර නැවතත් සමාලෝචිත වර්ෂයේදී වර්ධනය වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සහ රාජ්‍ය බදු නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු. 90,592,946 ක් වූ අධිකාරියේ අතිරික්තය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු. 799,261 ක් දක්වා පිරිහී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයේ 2.61 ක් වූ ජංගම අනුපාතය සමාලෝචිත වර්ෂයේදී 1.60 දක්වා පහත වැටී තිබූ අතර, ක්ෂණික අනුපාතයද 2.5 සිට 1.52 ක් දක්වා පහත වැටී තිබුණි. ඒ අනුව ආයතනයේ කෙටිකාලීන බැරකම් පියවීමේ හැකියාව පහත වැටී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

අධිකාරිය ස්ථාපිත කරන ලද 1999 අංක 17 දරන සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරී පනත අනුව ආයතනයේ අරමුණු මොනවාද යන්න නිශ්චිතව දක්වා නොමැති වුවද, ආයතනයේ කර්තව්‍යයන් ලෙස ජවන හා පිටිය තරඟ, පිහිනුම් තරඟ පැවැත්වීමට හා පුහුණු වැඩමුළු පැවැත්වීම සඳහා යටිතල පහසුකම් සැපයීම, විභාග සම්මන්ත්‍රණ හා සමුළු පැවැත්වීමට සහ මහජන රසාස්වාදය වෙනුවෙන් ගෘහස්ථ ශාලා පහසුකම් සැපයීම, ක්‍රීඩකයන් සඳහා නේවාසික පහසුකම් සැපයීම සහ එම කාර්යයන් සඳහා පැමිණෙන අයගේ රථවාහන නවතා තැබීමේ පහසුකම් සැපයීම දක්වා තිබුණි.මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට අයත් හා එමගින් පරිපාලනය කරනු ලබන ක්‍රීඩා හෝටලය 2015 වර්ෂය තුළ නිසි පරිදි දැල් ආවරණ සවිකර නඩත්තු නොකිරීම හේතුවෙන් නේවාසික පිරිස් වලට පරවියන්ගෙන් දැඩි බාධාවන් සිදුවන බව නිරීක්ෂණය විය.

(ආ) 2011 වර්ෂයේදී රු. මිලියන 112 ක් වැයකර ඉදිකරන ලද මීටර් 400 කෘත්‍රිම ධාවන පථය ඉදිකර මාස 2 කින් පසු හානිවීම හේතුවෙන් ජවන හා පිටිය ක්‍රීඩා තරඟ පැවැත්වීමට නොහැකි වී තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පුද්ගලික ආයතනවල ප්‍රචාරණ කටයුතු කිරීම මගින් ආදායම් වැඩිකර ගැනීමේ සහ අධිකාරියේ සේවා අලෙවිය වැඩි කර ගැනීමේ අරමුණෙන් අධිකාරිය විසින් අංක තාක්ෂණ දැන්වීම් (Digital) පුවරු දෙකක් රු. මිලියන 10 ක ඇස්තමේන්තුවක් යටතේ කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක මාවතට මුහුණලා සුගතදාස එළිමහන් ක්‍රීඩාංගන පරිශ්‍රයේ ඉදි කිරීමට සැලසුම් කර තිබුණි. ඒ අනුව රු. මිලියන 4.9 ක් වැයකර එක් දැන්වීම් පුවරුවක් පමණක් ඉදිකර තිබූ අතර අධිකාරිය විසින් සපයන සේවාවන් පිළිබඳ පුළුල් ප්‍රචාරයක් ලබා දීම මගින් අධිකාරියේ සේවා අලෙවිය වැඩි කර ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටු කර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. තවද, ඇස්තමේන්තු ගත මුදලෙන් රු. මිලියන 5 ක් විධිමත් අනුමැතියකින් තොරව එළිමහන් ක්‍රීඩාංගනයේ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතියට මාරු කර තිබුණි.

(ආ) 2014 වර්ෂයේ ආපන ශාලාව ඉදි කිරීමේ කර්මාන්තය සඳහා වෙන් කරන ලද රු. මිලියන 10 ක් වූ ප්‍රතිපාදන මුදල භාවිතා කරමින් විධිමත් අනුමැතියකින් තොරව ආරක්ෂිත කැමරා පද්ධතියක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතියක් සිදු කර තිබුණ නමුත් එකී ව්‍යාපෘතිය මගින් ස්ථාපිත කළ ආරක්ෂක දර්ශන අපැහැදිලිවීම හා එහි කැමරා පද්ධති නිතර අක්‍රියවීම හේතුවෙන් ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණි

(ඇ) අධිකාරියට අයත් ක්‍රීඩා හෝටලයේ ආපන ශාලාව ගිවිසුමකින් තොරව ව්‍යාපාරිකයෙකුට මාස 04 ක කාලයක් පවත්වා ගෙන යෑමට ඉඩ හැර තිබූ නමුත් ඊට අදාළ බදු මුදල්, විදුලි හා ජල බිල්පත් වෙනුවෙන් අයවිය යුතු රු. 252,929 ක් අයකර ගැනීමට 2018 මාර්තු මාසය වනවිටද කටයුතු කර නොතිබුණි.

**4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------------

අධිකාරියට අයත් කාමර 42 කින් සමන්විත ක්‍රීඩා හෝටලයේ කාමර 03 ක් වර්ෂයක කාලයක් සහ වර්ග අඩි 800 ක බීම හල වර්ෂ 08 ක කාලයක් අභාවිතව පැවතුණි.

**4.4 ආර්ථික නොවූ ගනුදෙනු**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් ගෙවිය යුතුව තිබූ එකතු කළ අගය මත බදු නියමිත දිනට නොගෙවීම හේතුවෙන් රු.3,310,537 ක අධිභාරයක් දේශීය ආදායම් කොමසාරිස් වෙත ගෙවිය යුතුව තිබුණි.

(ආ) ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් තොරව රු. මිලියන 30 ට අඩු කර්මාන්ත ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම මගින් සිදු කර ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණද, ඊට පටහැනිව රු. මිලියන 63 කට ඇස්තමේන්තු කර තිබූ ක්‍රීඩා හෝටලය නවීකරණ කටයුතු අදියර 03 ක් යටතේ බාණ්ඩ කර ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව තෝරාගත් සමාගමක් වෙත 2015 අප්‍රේල් 08 දින ලබා දී තිබුණි. ගිවිසුම් ප්‍රකාරව මෙම කර්මාන්තය 2015 අගෝස්තු 04 දින නිම කළ යුතු වුවද 2018 මාර්තු මාසය වනවිටද නිමකර නොතිබුණි.

(ඇ) වර්ෂ 10 කට ආසන්න කාලයක් අභාවිතව පැවති වර්ග අඩි 990 කින් සමන්විත ආපන ශාලාව මිල ගණන් කැඳවීමකින් තොරව 2015 වර්ෂයේදී රු. 40,000 ක මාසික කුලියට බදු දී තිබූ අතර බදුකරු විසින් තවත් වර්ග අඩි 214 ක් ආපන ශාලාවේ කටයුතු සඳහා මුදල් ගෙවීමකින් තොරව පරිහරණය කර තිබුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

-----------------------------------

අධිකාරිය විසින් ආරක්ෂක සේවයට බඳවා ගෙන තිබූ නිලධාරීන් 27 දෙනෙකු එම සේවයේ නොයොදවා මුදල් අයකැමි, අභ්‍යන්තර විගණනය වැනි රාජකාරිවල යොදවා තිබුණි.

**4.6 වාහන උපයෝජනය**

-------------------------

ක්‍රීඩා අමාත්‍යාංශයට අයත් කැබ් රථයක් විධිමත් ලෙස අධිකාරිය වෙත පවරා ගැනීමකින් තොරව අධිකාරිය විසින් රක්ෂණය කර තිබූ අතර එම කැබ් රථය අලුත්වැඩියා නොකිරීම හේතුවෙන් භාවිතයෙන් ඉවත් කර තිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) වත්කම් කළමනාකරණය | (i) වත්කම්වල අගය නිවැරදි ලෙස ප්‍රාග්ධනිත නොකිරීම. |
| | (ii) ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොගැනීම . |
| | (iii) සම්පූර්ණ ක්ෂය කරන ලද නමුත් භාවිතයට ගනු ලබන වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත නොකිරීම. |
| (ආ) ගිණුම්කරණය | ගිණුම්කරණය සඳහා මිලදී ගත් මෘදුකාංගය මගින් සම්පූර්ණ ගිණුම් පද්ධතිය ක්‍රියාත්මක නොකිරීම. |
| (ඇ) ණයගැති පාලනය | (i) උපරිම ණයගැති සීමාව හා කාලය සම්බන්ධයෙන් සීමා නීර්ණය නොකිරීම. |
| | (ii) ණයගැතියන්ගේ ශේෂ සනාථන ලබා නොගැනීම. |
| (ඈ) මානව සම්පත් කළමනාකරණය | ඇඟිලි සලකුණු යන්ත්‍ර නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම. |
| (ඉ) කොන්ත්‍රාත් පරිපාලනය | අවශ්‍යතා නිසි පරිදි හඳුනා ගැනීම, ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය කිරීම, නිවැරදි ඇස්තමේන්තු සකස් කිරීම, නිසි අධීක්ෂණයක් සිදුකිරීම, ප්‍රමාද ගාස්තු අය කිරීම යන මූලික කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු නොකිරීම. |